පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.18 පැය 2340 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /773/2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk |

## වෙඩි තැබීමකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - මනම්පිටිය පොලිස් වසම

2024.04.18 වන අද දින රාත්‍රී කාලයේ මනම්පිටිය පොලිස් වසමේ ආයුවෙර්ද පෙදෙස පිහිටි **"ජීවමාන ක්‍රිස්තු දේවස්ථානය"** නම් වූ සිද්ධස්ථානයට පුද්ගලයෙකු වෙඩි තබා පලාගොස් ඇති බවට මනම්පිටිය පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර වෙඩි තැබීම සඳහා යොදා ගන්නා ලද මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන ප්‍රධාන පාර, මනම්පිටිය ලිපිනයේ පදිංචිකරුවෙකි.**

වෙඩි තැබීමෙන් ජීවිත හානි කිසිවක් සිදුව නොමැති අතර දේවස්ථානයේ ජනේලයකට අලාභ හානි සිදුව ඇත. සැකකරු දේවස්ථානයේ ගේට්ටුව අසලට පැමිණ විපරම් කර බැලීමෙන් අනතුරුව නැවත මාගර්යට ගොස් මෙම වෙඩි තැබීම සිදු කර පලාගොස් ඇත.

මෙම සිද්ධස්ථානයේ දේවගැතිවරයා සමඟ තිබූ පුද්ගලික ආරවුලක් හේතුවෙන් වෙඩි තැබීම සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇති අතර මනම්පිටිය පොලීසිය වැඩිදුර විමශර්න සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**